


" පාටවලින් හැඩවෙලා - ලොවට පිපෙන
සුවඳ කැකුළු මල් මිටක් "

# අතුරු මිතුරු

සම්මානිත මහාචාර්ය **කුසුමා කරුණාරත්න**

"සුවඳ කැකුළු මල් මිටක් මෙන්න පිපෙනවා ...." වසරක් ගෙවී නව වසරක් උදාවෙමින් තිබිය දී, එක් සන්ධ්‍යා භාගයක, මා ශ්‍රවණය කළ සුන්දර ළමා ගීතයක මුල් පද කීපයයි, ඒ. බොහෝ ශ්‍රී ලාංකික විද්වතුන්, බුද්ධිමතුන් යම් යම් කරුණු හේතු කොටගෙන විදෙස් ගත වීමේ ප්‍රවණතාව එදත් අදත් අඩු වැඩි වශයෙන් දක්නට ලැබීම, ලක්මවගේ අපමණ දුක්දොම්නස්වලට හේතුවන බව අමුතුවෙන් කිව යුතු නොවේ. කෙසේ නමුදු, ලක් පුතුන් හා ලක් දියණියන් විදෙස්ගතව සිටිමින් දක්වන කුසලතා හා ඉටුකරන මහඟු මෙහෙවර ගැන සිතා අපි කවදත් සැනසුම් සුසුම් හෙළන්නෙමු.

මෙල්බර්න් නගරයේ වාසයකරන එවන් කුසලතාවලින් හෙබි ලක්දරුවන්ගේ කීර්ති කදම්බය ප්‍රකට කරවන අනේකප්‍රකාර නිර්මාණ අතුරෙන් ඉහත සඳහන් ගීතය ඇතුලත් "අතුරු මිතුරු" ළමා ගී සරණිය මා හිත් ගත්තකි. සාහිත්‍ය කලා නිර්මාණයේදී බොහෝ විට අපගේ අවධානය යොමුවන්නේ වැඩිහිටි පාඨක, රසික පිරිස වෙතය. ශ්‍රී ලාංකික (සිංහල) සාහිත්‍ය දෙස බැලුවද ළමා සාහිත්‍යයට ඇත්තේ කෙටි ඉතිහාසයකි. ඒ නයින් බලන කල දරුවන් වෙනුවෙන්, තමුන් ඇසුරෙන් ලද අත්දැකීම් පාදක කොටගනිමින්, ඔවුන්ගේ රසඥතාව වර්ධනය වන අයුරින් ලියවෙන නිර්මාණවල අවශ්‍යතාව අද වැඩි වැඩියෙන් දැනෙන්නට පටන්ගෙන ඇත.

වෘත්තියෙන් ඉංජිනේරුවරයෙකු වන සිසිර දිසානායක ඊට අමතරව කුසලතා පිරිපුන් නිර්මාණ කරුවෙකි. විශිෂ්ට ගී පද රචකයෙකි. සිය දූ පුතුන් ඇසුරින් ලද අත්දැකීම්වල ට තමන් විඳි ගැමි ජීවිතයේ සුවඳ හා රස ගල්වමින් දරුවන් වෙනුවෙන් රචනා කරන ලද ගී විස්සක් සිය මව්බිමේ මෙන්ම ඕස්ට්‍රේලියාවේ ද වෙසෙන ලක් දූ පුතුන් වෙත තිළිණ කිරීමට සූදානමින් සිටින සිසිරගේ එම ගී පිළිබඳව මට ද අහම්බෙන් මෙන් සවන් දීමට අවස්ථාව උදා විය. ජාතියක





සෞභාග්‍යමත් අනාගතයක් පතන අපගේ වැඩි අවධානය යොමු විය යුතුව ඇත්තේ දරුවන් කෙරෙහිය. ඔවුන්ගේ නැණැස පාදනු පමණක් නොව කලා කුසලතා වර්ධනයට අත දීම සමඟම ම "පෙදෙහි රසහව් විඳිනා" දෙනෙත් ඔවුනට පාදා දීම ද අපගේ පරම යුතුකම බව හඳුනාගෙන සිටින සිසිර දිසානායක කලාකරුවා මෙවර එළිදක්වන ළමා ගී සරණිය විවිධ අංශවලින් පරිපූර්ණ වූවකි. නැවුම් සංකල්ප හා විවිධාකාර අනුභූතීන් අනුව ලියැවුණ පද රචනා අතර ජන ගී නාද රටා වලට ගැලපෙන ගැමි බස් වහරින් යුත් රචනාද, ප්‍රාදේශීය බස් වහර ඇසුරින් යුත් රචනාද, ශ්‍රී ලංකාවේ ආදි වාසී බස ඇසුරින් කළ රචනාවක් ද ඇතුලත් වෙයි.

"පාට වලින් හැඩවෙලා - ලොවට පිපෙන - සුවඳ කැකුළු මල් මිටක්" ලෙසින් මව් බිමේ වෙසෙන දීප්තිකා අශානි, නදීෂා පියුමි, නිමාන හංසක, කසුන් වරංග, යශාරු පංකජ, නිරූපදි නිශාබ්‍ය, ගෙහාන් මලිත් නම් වූ සිඟිති දූ පුතුන් වැඩිහිටි අප වෙත ගෙන එන්නේ ඔවුන් වැනි දරු දැරියන් පිළිබඳ සුන්දර සිතුවිලි සමුදායකි. පාට වලින් හැඩවී සුවඳවත් මල් කැකුළු මිටක් ලෙසින් ඔවුන් අප ඉදිරියට එන්නේ වර්තමාන ලෝකයේ දරුවන් කෙරෙහි දක්වන අවධානය පිළිබඳව අපට යළි යළිත් සිහිපත් කරවමිනි. දරුවන්ට ඔවුන්ගේම ලෝකයක් තනා දෙන්නට වෙර දරන සියල්ල න් අතින් ම නැවත ලොවට එය සිදු වේ ද යන ප්‍රශ්ණය අප තුළ පැන නඟින අවස්ථා අල්ප නොවේ. එසේ නම් මේ සුවඳ කැකුළුවලට මව්පිය වැඩිහිටි සුරතලය නොමඳව ලබමින්, ගුරුවරුන් අතින් සිප් සතර දැන උගෙන, සරසවියගේ වරම් ලබා සිය දස්කම් පාන්නට ඉඩ දීම, ඒවා බලා සතුටු වීම පමණක් නොව ඔවුන් අගැයීම ද අප අතින් සිදු විය යුතු බව සිසිර මෙම ළමා ගී සරණියේ ආරම්භක ගීතයෙන් ම ප්‍රකාශ කරයි.

දුරු රට හැදෙන වැඩෙන තම ළමා ළපටින්ට සිය රටේ උරුමකම්, එහි පැවති සුන්දර අතීත සිහිවටන විඳගන්නට නොලැබීම නිසා ළතැවෙන අත්තම්මලා කොතරම්නම් ඇත්ද? "අතුරු මිතුරු දඹදිවතුරු - රාජ කපුරු සෙට්ටියා......" යනුවෙන් ළමා වියේ දී මවගෙන් හා මිත්තණියගෙන් අසා පුරුදු මෙම ගී පද රචකයා විදෙස් රටක අද හැදෙන වැඩෙන සිඟිත්තන් ට එහි රසයෙන් බිඳක් හෝ ලබා දෙන්නට හිතා රචනා කළ නිර්මාණ කීපයක්ම මෙම ළමා ගී සමුච්චයට ඇතුළත් කර ඇත. "අතුරු මිතුරු සෙට්ටියා - අපේ මිතුරු කට්ටියා......" එදා ළමා වියේ දී අප ක්‍රීඩා කරමින් ගැයූ ගී වලට නව මුහුණුවරක් දෙමින් , අද හැදෙන වැඩෙන දරුවන්ට විශේෂ ආකාරයේ පදමාලාවක් හුරු කරමින් ගයන්නට අවස්ථාව සැලසෙන මෙවන් ගීත සැබෑ විනෝදයක් ඔවුනට ලබා දෙනු ඇත. මෙම ගීතය සිඩ්නි නුවර තිසල් පාදුක්ක විතාන, මෙල්බර්න් නුවර හසිනි ඉලංගරත්න, සරිනි දිසානායක, පියත් දිසානායක, ජනනි මුණසිංහ, කසුන් මුණසිංහ, සාවින්ද මුණසිංහ, දිමිති කස්තුරිරත්න, නෙත්මි කුලතුංග හා හිමේෂ කුලතුංග යන ළමා පිරිස ගයන ගීතයකි.

විශාරද නන්දා මාලනී වැනි ප්‍රවීණ ගායිකාවකගේ ද සහාය ලබා ගනිමින් සරිනි දිසානායක දැරිය ගායනා කරන "නෙරිය තියන්නේ ළමා සාරියේ....." නම් වූ ගීතය මවක් හා දුවක් අතර වන සංවාදයක ස්වරූපයෙන් රචනා වී ඇති මියුරු මෙන්ම අර්ථවත් වූ ද ගීතයකි. ළමා සාරිය, ඔසරිය වැනි සීදේවී කාන්තාවන්ට හා සීදේවී දූ කුමරියන්ට ඔබින ඇඳුම්, වත්මන් සමාජයේ ශීඝ්‍රයෙන් ඉවත්ව යමින් පවතින අවදියක මෙ වැනි ගීතයකින් තම දරුවනට යළිත් එය මතක් කර දීමක් ද සිදුවනු ඇතැයි ගී පද රචක සිසිර දිසානායක අපේක්ෂා කරන්නට ඇත. දරුවන් දහම් පාසැල් යැවීම සඳහා ඉරිදා දිනයේ උදෑසනින් ම අවදි කරවීමත්, ළමා අපචාරයක් ලෙස හඳුන්වන්නට පෙළඹෙන ඇතැමුන් වෙසෙන රටකට මෙවන් ගීතයක් මඟින් දහම් පාසැල මතක් කරවා දීම සැබැවින්ම අගය කළ යුත්තකි.ළමා සාරියේ නෙරිය තියන හැටි අම්මාගෙන් අසා දැන ගනු පමණක් නොව අම්මා ද දියණිය කැටුව දහම් පාසැලට ගොස් දරුවන්ට දහම් කියා දීමට, බැති ගී ගැයීමට සූදානම් වන ඉතා සුන්දර දර්ශනයක් සිහිපත් කරවන මෙම පද පෙළ ප්‍රවීණ සංගීතවේදී රෝහණ වීරසිංහගේ මධුර සංගීතයෙන් ඔපවත් වී තිබීම තවත් විශේෂ වූ කරුණකි.

මෙල්බර්න් නගරවාසී ශ්‍රී ලාංකිකයන් හැකි තරමින් හෝ සිය සංස්කෘතික ලක්ෂණ රැකගැනීමට හා දරුවන්ට ඒවා හුරු පුරුදු කරවන්නට වෙර දරණු අපි දැක ඇත්තෙමු. එවන් අංශ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන ගීත ද මේ අතර වෙයි.

"පෝය පෝය ගැන්න රටේ
උන්නු අපේ මුතුන් මිත්තෝ
දුන්නු අපේ හොඳ දේවල්-අපිත් ගෙනාවා....! "

"ලබන අළුත් අවුරුද්ද ම
කිරි පැණියෙන් ඉතිරෙන්නට
පැතුම් පතනවා-අපි පැතුම් පතනවා....! "

සිංහල අළුත් අවුරුද්ද වේවා, ලෝකයේ සියළුම රටවල් පාහේ සමරන ජනවාරි පළමුවන දට යෙදෙන අළුත් අවුරුද්ද වේවා, කිරි පැණියෙන් ඉතිරෙන්නට මේ දූ පුතුන් පැතුම් පතන්නේ ඔවුනොවුන්ටම ය. දෙමාපිය වැඩිහිටි ගුරුවරු ආදී සියල්ලන්ට ම, මෙල්බර්න් නුවර සංඝපද්ම කලායතනයේ තිළිණි රණසිංහ, නුවන් රණසිංහ, දිමිති කස්තුරිරත්න, අකිල කස්තුරිරත්න, මනීෂා ගමගේ, තිලාන් ගමගේ සහ මහනුවර මනීෂ විජේකෝන් යන දූ දරු පිරිස ගයන මෙම ගීය සිසිර දිසානායක ළමයින් වෙනුවෙන් දක්වන අවධානය ද පළ කරන්නකි.

දෙමාපිය - දරු සම්බන්ධතාව වූ කලී කිරි කැටි බිළිඳාගේ පටන් වැඩි වියට පත් දූ පුතුන් ද නොමඳව අවබෝධ කරගත්තකි. වයසින් වැඩෙන දරුවන් අතින් ක්‍රියාවෙන් එහි වෙනසක් ඇති වන අවස්ථා පිළිබඳ ව චෝදනා නැගුණ ද "කිරි සුවඳ", "ලේ සුවඳ" මුළු මානව සංහතියට ම වෙනසකින් තොරව උරුම වූවකි. අප්පච්චිගේ උරතලයේ සැතපෙන සිඟිති පුතුට දැනෙන්නේත් ඒ ළෙන්ගතු ආදරයමයි. නො වෙනස් වන ලේ සුවඳමයි.

"උණු සුමි තුරුලේ
මේ හුරු සුවඳයි ගැවසෙන්නේ
ගේ පුරා ම අප්පච්චී....."

සිය පුතුට එසේ හැඟෙද්දී දයාබර අප්පච්චී කෙනෙකු වන සිසිරට ද දැනෙන්නේ.....

"සුරතල් නළලේ
ලේ හුරු සුවඳයි මේ එන්නේ
සැමදා ම මා පුතුනේ....."

යන හැඟුම් බව ප්‍රකට කරවන ගීතයක් මෙම ගීත සමුච්චයට එක් වී ඇති අතර, වික්ටර් රත්නායක නම් වූ විශිෂ්ට ගායකයා හා සංගීතඥයා එය ගයනුයේ ද සිය ආදරණීය පුතුන් ගැන ද සිහිපත් කරගනිමිනි. පුතු ලෙසින් ගායනයට එක්වන්නේ සිඩ්නි නුවර තිසල් පාදුක්කවිදානගේ දරුවායි. මිනිස් හැඟීම් හා අත්දැකීම් පෞද්ගලික වූ ඒවා ලෙස ඇරඹී පොදු අනුභූතීන් බවට පත්වනුයේ දක්ෂ නිර්මාණකරුවන් පාන කුසලතා මඟිනි. සිසිර දිසානායක අතින් රචනා වූ මෙම ළමා ගීය විශ්ව සමාජයටම පොදු අත්දැකීමක්, පිය - පුතු ආදරයක් ලෙස ඔපවත් වී ඇත.

දරුවන්ට ලෝකයක් තනා දී අපගේ යුතුකම් කොටස ඉටු කළ යුතු බව නිතර සිතන පතන සිසිර දිසානායක ගී පද රචකයා සමඟ අපි ද එක්වෙමින් එම පැතුමට හා නිර්මාණකරණයට ද සහාය විය යුතු වෙමු.

*සම්මානිත මහාචාර්ය*

**කුසුමා කරුණාරත්න**